දු.ක.ප. RTM 793

පොලිස්පතිගෙන්

සියළුම:- ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති වරුන්
නියෝජ්‍ය පොලිස්පති වරුන්
කොට්ඨාස භාර නිලධාරීන්
අධ්‍යක්ෂ වරුන්
අණදෙන නිලධාරීන්
දිස්ත්‍රික්ක භාර නිලධාරීන්
මූ.පො.ප/ස්ථානාධිපති
(ක්‍රියාකාරි සහ ප්‍රාදේශිය කොට්ඨාස)

23 AUG 2017

3067

**රාජ්‍ය නිවේදිත නිලධාරීන්ගේ සහ ස්ථානාධිපති වරුන්ගේ වාර්ෂික ස්ථාන මාරුවීම්**

ජාතික පොලිස් කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද රාජ්‍ය නිවේදිත නිලධාරීන්ගේ සහ ස්ථානාධිපති වරුන්ගේ ස්ථාන මාරු කිරීමේ ප්‍රතිපත්තියට අනුව 2017.08.01 දිනැතිව නිකුත් කරන ලද ස්ථාන මාරුවීම් චක්‍රලේඛ අංක 2017/01 ඇමුණුම 01 වශයෙන් ඉදිරිපත් කරමි.

එම ස්ථාන මාරුවීම් චක්‍රලේඛයට අනුව වාර්ෂික ස්ථාන මාරු කිරීම් 2018 ජනවාරි මස සිට ක්‍රියාත්මක කිරීමට යෝජිත බැවින් ඔබ යටතේ සිටින සියළුම රාජ්‍ය නිවේදිත නිලධාරීන් සහ ස්ථානාධිපතිවරුන් මේ පිළිබඳව දැනුවත් කරන ලෙසටත්, ඉහත චක්‍රලේඛයේ විධිවිධාන යටතේ ස්ථාන මාරු කිරීම් වලට අදාලව හඳුන්වා දී ඇති ආදර්ශ අයදුම්පත් උපයෝගී කර ගනිමින් අදාල අයදුම්පත් ඉදිරිපත් කරන ලෙසට ජාතික පොලිස් කොමිෂන් සභාව විසින් දන්වා ඇත.

ඒ අනුව 2018 වර්ෂයට අදාල සියළුම ස්ථාන මාරුවීම් ඉහත ජාතික පොලිස් කොමිෂන් සභාවේ චක්‍ර ලේඛය පරිදි සිදු කරන බැවින්, ස්ථාන මාරුවීම් අපේක්ෂා කරන සියළුම රාජ්‍ය නිවේදිත නිලධාරීන් සහ ස්ථානාධිපතිවරුන්ගේ ඉල්ලීම් 2017.09.15 දිනට පෙර ලියාපදිංචි තැපැල් මගින් පහත සඳහන් ලිපිනයට එවන ලෙසටත් එහි පිටපතක් මා වෙත යොමු කරන ලෙසටත් ඔබ යටතේ සිටින සියළුම රාජ්‍ය නිවේදිත නිලධාරීන් සහ ස්ථානාධිපතිවරුන් දැනුවත් කිරීමට කටයුතු කරන ලෙස දන්වමි.

ලිපිනය :- ලේකම්,
ජාතික පොලිස් කොමිෂන් සභාව
අංක 09 ගොඩනැගිල්ල
B.M.I.C.H. පරිශ්‍රය, බෞද්ධාලෝක මාවත
කොළඹ 07.

මගේ අංකය : ඩී/එම්ඩී/ඒඩීඑම්/1639/2017

පුජිත් ජයසුන්දර
පොලිස්පති
2017.08.21